# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2391/30 - 2024 ජූලි මස 05 වැනි සිකුරාදා - 2024.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

තංගල්ල ප්‍රාදේශීය සභාව

**විනෝද බද්ද**

***1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.***

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුළත් වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2023.06.19 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු තීරණ අංක 01-07 යටතේ සම්මත කර ඇති යෝජනාව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත අනුව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
ගාල්ල,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද පනතේ 2(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තංගල්ල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අය කළ යුතු යැයිද, මෙම යෝජනාව 2023.09.01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයිද යෝජනා කරන්නීය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා විසින් තීරණය කරන ලදී.

EOG 07 - 0039


1A - PG 6762 — 07 (2024/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*